

මොහාන් සමරණායක



# ත්‍රස්තවාදයට එරෙහි බටහිර ලෝකයේ දෙබඩි පිළිවෙත

ජූලි 07 වනදා ලන්ඩනයේ උමං දුම්රිය 3 ක සහ බස්රියක සිදුකළ මරාගෙන මැරෙන බෝම්බ පිපිරීම් සමඟ අන්තර්ජාතික ප්‍රජාව ත්‍රස්තවාදය පිළිබඳව නව කතාබහකට අවතීරණ වී තිබෙනවා. එමෙන් ම, ත්‍රස්තවාදයට එරෙහි සටනට නව මුහුණුවරක් ලැබී තිබෙනවා. මෙය කීප ආකාරයකින් විස්තර කරන්න පුළුවන්.

බටහිර රටවල් මෙම ප්‍රහාරත් සමඟ ත්‍රස්තවාදී ප්‍රහාරවල භීතියෙන් ඇලලී ගියා යැයි කීවොත් වඩාත් නිවැරැදි ය. ලන්ඩනයේ ප්‍රහාරයත් සමඟ අමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව වැනි රටවල් මෙන් ම යුරෝපයේ සෑම ප්‍රබල රටක සෑම නගරයක ම පාහේ විශාල කම්පනයක් හටගත්තා. ඒ වාගේමයි එම රටවල් ආරක්ෂාව සඳහා විශේෂ වැඩපිළිවෙළයන් යෙදුවා. මෙය කොතරම් කඩිනමින් සිදුවූවා දැයි කිවහොත් බ්‍රිතාන්‍ය සහ ප්‍රංශය වහා ම ක්‍රියාත්මක වී ත්‍රස්තවාදය මර්ධනය කිරීම සඳහා වන විශේෂ වැඩපිළිවෙළක් සඳහා පවා එකඟතාවයක් ඇතිකර ගනු ලැබුවා.

මේ හා සමඟ ම ත්‍රස්තවාදය සම්බන්ධයෙන් මෙතෙක් ලෝකයේ පවතින අර්ථකථනය පිළිබඳව බරපතල ප්‍රශ්නයක් මතු වුණා. විශේෂයෙන් මෙය යළි සකස් විය යුතු බවට මතයක් ගොඩනැඟුණා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් කොෆී අනන් පවා ත්‍රස්තවාදය හා ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳව පුළුල් අර්ථකථනයක් කඩිනමින් සිදුවිය යුතු බවට ප්‍රකාශයක් කළා.

මේ ප්‍රහාරත් සමඟ හඳුනාගත හැකි වූ තවත් කැපී පෙනෙන ලක්ෂණයක් තමා අමෙරිකාව බ්‍රිතාන්‍ය ප්‍රමුඛ බටහිර ජාතීන් ත්‍රස්තවාදය සම්බන්ධයෙන් අනුගමනය කරන දෙබිඩි දෙපිටකාට්ටු පිළිවෙත. ඒ පිළිබඳවයි සමාජය පුරා පුළුල් සංවාදයක් මතු වුණා. විශේෂයෙන් බටහිර ජනමාධ්‍ය ත්‍රස්තවාදය සම්බන්ධයෙන් වාර්තා කරන ආකාරය පිළිබඳව පුළුල් සංවාදයක් ගොඩනැඟුණා. මාධය ලෝකයේ ඉහළ තැනකලා කතාකරන බීබීසී ආයතනය ගැන පවා මෙහි දී ප්‍රශ්න කෙරුණා. බීබීසී ආයතනය මෙම ප්‍රහාර හඳුන්වා දුන්නේ ත්‍රස්තවාදී ප්‍රහාර එහෙමත් නැත්නම් බෝම්බකරුවන්ගේ ප්‍රහාර යනුවෙන්. එහෙත්, එම ජනමාධ්‍ය ම තුන්වන ලෝකයේ රටවල සිදුවන මෙවැනි ත්‍රස්තවාදී ක්‍රියා හඳුන්වන්නේ ඊට හාත්පසින් ම වෙන් ආකාරයකින්.

උදාහරණයක් ලෙස දක්වනවා නම් ශ්‍රී ලංකාවේ කොටි සංවිධානය මෙවැනි ත්‍රස්තවාදී ක්‍රියාවල නියැලෙන විට ඔවුන් ඒවා ත්‍රස්තවාදී ප්‍රහාර බෝම්බකරුවන්ගේ ප්‍රහාර කියා හඳුන්වන්නේ නැහැ. මෙතැන දී මම එල්ටීටීඊ සංවිධානය බිහිවීමට බලපෑ හේතු නැති බව කියන්නේ නැහැ. නමුත්, ඔවුන්ගේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග ම්ලේච්ඡ අශිෂ්ඨ ත්‍රස්තවාදී ක්‍රියා බවට කිසිදු විවාදහක් නැහැ. කොහොම වුණත් මෙතැනදි බීබීසීය වැනි මාධ්‍ය කොටි සංවිධානය වැනි සංවිධාන හඳුන්වන්නේ කැරැලිකාර සටන්කාමී සංවිධාන ලෙස. එහෙත්, ඔවුන්ට ප්‍රහාර එල්ල කළ පාර්ශ්ව හඳුන්වන්නේ අන්තවාදීන් එහෙමත් නැත්නම් පවතින ක්‍රමයට එරෙහිව යන්නන් (ෂබ්මරටැබෑ) ලෙසයි. මෙය මා දකින්නේ හිතාමතාම කරන වැරැදි මාධ්‍ය භාවිතයක් ලෙසයි. ලංකාවේ මහ බැංකු බෝම්බ ප්‍රහාරය සිදුවූ අවස්ථාවේ එවකට ලංකාවේ සිටි බීබීසී වාර්තාකාරිනිය එම ප්‍රහාරය එල්ටීටීඊය විසින් සිදුකළ එකක් බව ප්‍රකාශ කිරීමට මැලිවුණා. එහි දී ඔවුන් කීවේ මෙම ප්‍රහාරය එල්ටීටීඊ කැරැලිකරුවන් විසින් එල්ල කරන ලද්දක් බවට ශ්‍රී ලංකා ආණ්ඩුව පවසන බවයි. එහෙත් ලන්ඩන් ප්‍රහාරය කිසිම දෙගිඩියාවකින් තොරව අල්කයිඩා එහෙමත් නැත්නම්, ඉස්ලාමීය ත්‍රස්තවාදීන් විසින් එල්ලකරන ලද්දක් බවට කියන්නට ඔවුන් පැකිලුණේ නැහැ.

මෙම තත්වය නිසා ත්‍රස්තවාදය යන්නට පොදු අර්ථකථනයක් ඇතිකර ගැනීම පිළිබඳව එකඟත්වයක් ඇතිකළ යුතු බවට යළි යළිත් ප්‍රකාශ වී තිබෙනවා. ඇත්තෙන් ම නිරායුධ සිවිල් වැසියන් ඝාතනය කිරීම, දේපළ වැනසීම, ආගම්වලට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම ආදී මේ සියලු ක්‍රියා ත්‍රස්තවාදය ලෙස හඳුන්වා දිය යුතු වෙනවා. එසේ නොකරන්නේ නම් එය බරපතල ප්‍රශ්නයක්.

මා මෙතන දී පැහැදිලිව සඳහන් කළ යුතු කරුණක් තමයි ත්‍රස්තවාදය අවි බලයෙන් ම පිටුදැකිය නොහැකි බව. ඒ සඳහා සාකච්ඡා මේසයට යෑම අත්‍යවශ්‍ය වෙනව. ඒ හරහා ත්‍රස්තවාදයට මුල් වී ඇති සමාජ දේශපාලන ආර්ථික හේතුවලට පිළියම් යෙදිය යුතු වෙනවා. හැබැයි මෙතනදි ප්‍රචණ්ඩත්වයට එරෙහිවත් පියවර ගත යුතුමයි. ඒවා පාලනය කළ යුතුමයි. බටහිර රටවල් තමන්ට ත්‍රස්තවාදී තර්ජන එල්ල වන විට මුලින් ම කරන්නේ අවි බලයෙන් ඒවා පාලනය කිරීම. ඔවුන් සමාජ ආර්ථික හේතු ගැන අවධානයක් යොමු කරන්නේ ම නැති තරම්. එහෙත්, ඔවුන් ලංකාව වැනි රටවල්වලට කියන්නේ ඊටවඩා හාත්පනිස්න ම වෙනස් කතාවක්. ඔවුන් ප්‍රචණ්ඩත්වය ගැන කතා කිරීම දෙවනුව තබා ප්‍රශ්නවලට මුල් වී ඇති සමාජ ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්නයි කියනවා. මෙය ඉතා දුෂ්ඨ ස්වරූපයක්.

මෙතන දී යමෙක් තර්ක කරන්න පුළුවන් අද බටහිර ලෝකය හමුවේ ඇති ත්‍රස්තවාදී තර්ජනයට මුල් වූ සමාජ ආර්ථික හේතු නොමැති බව. ඒ සඳහාත් සමාජ ආර්ථික හේතු තිබෙනවා. ඉරාක ආක්‍රමණය, මැදපෙරදිග තෙල් සම්පත කොල්ල කෑම, පලස්තීන ප්‍රශ්නයේ දී ආසාධාරණ ලෙස ඊශ්‍රායලය වෙනුවෙන් පෙනී සිටීම, ඇෆ්ගනිස්ථානයට පහර දීම ආදී හේතු ඒ සඳහා බලපෑවා. මෙම තත්වය අද බටහිර ඇතැම් දේශපාලඥයන්

20 පිටට

